ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂ/ ප්‍රවෘත්ති සංස්කාරක **2017 අප්‍රේල් 24**

# ප්‍රවෘත්ති නිවේදනය

## ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය - 2016

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

**ටෙලි:011-2147446 ෆැක්ස්: 011-2147447 ඊමේල්: sample.survey@statistics.gov.lk**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ. ජේ. සතරසිංහ මහතා ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කර සිටියේ 2016 වර්ෂයේදී ඇස්තමේන්තුගත රැකියා වියුක්ති අනුපාතය 4.4% ක් වන බව යි. අදාල යොමු කාලය තුල රැකියාවක් නොමැති, රැකියාවක් සොයමින් සිටින, රැකියාවක් සෙවීමට කිසියම් ක්‍රියා මාර්ගයක් ගත් හා රැකියාවක් ලැබුණ හොත් එය කිරීමට හැකියාව ඇති පුද්ගලයින් රැකියා විරහිත පුද්ගලයින් සේ සලකනු ලබයි. මුළු රැකියා විරහිත පුද්ගලයින් ප්‍රමාණය, ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ගත්විට විරැකියා අනුපාතය ලෙස හඳුන්වනු ලබයි.

වයස අවු. 15 හා ඊට වැඩි ජනගහනය ශ්‍රී ලංකාවේ වැඩ කරන වයසේ පසුවන ජනගහනය ලෙස සලකයි. වැඩ කරන වයසේ ජනගහනය අතරින් සලකනු ලබන යොමු කාලය තුල රැකියා නියුතු හෝ රැකියා විරහිත මුළු ජනගහනය ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය හෙවත් ශ්‍රම බලකාය වේ. 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය මිලියන 8.3 ක් පමණ වේ. ඉන් 63.8 ක ප්‍රතිශතයක් පිරිමි ජනගහනය වන අතර 36.2 ක ප්‍රතිශතය ගැහැණු ජනගහනය වේ.

ශ්‍රම බලකායට අයත් වන පුද්ගලයින් සංඛ්‍යාව වැඩකරන වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට ශ්‍රම බල සහභාගිත්වතා අනුපාත ලෙස හඳුන්වනු ලබයි (LFPR). 2016 වර්ෂයට අදාල සමීක්ෂණ ප්‍රතිඵල වලට අනුව සමස්ථ ශ්‍රම බල සහභාගිත්වතා අනුපාතය සියයට 53.8 ක් වන අතර පුරුෂයින් හා ස්ත්‍රීන් සඳහා ශ්‍රම බල සහභාගිත්වතා අනුපාත පිළිවෙළින් 75.1% හා 35.9% වේ.

පුද්ගලයෙකු අදාල යොමු කාලය තුල අඩුම තරමින් පැයක්වත් වැටුප් ලබන සේවකයෙකු, සේවායෝජකයෙකු, තමාගේ වැඩ කටයුතු කරන්නෙකු හෝ පවුලේ ආර්ථිකයට දායකවන්නෙකු ලෙස කිසියම් වැඩක නිරත්වූයේ නම් එම පුද්ගලයා රැකියා නියුතු පුද්ගලයෙකු ලෙස නම් කරයි. 2016 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත රැකියා නියුක්තිකයින් ප්‍රමාණය මිලියන 7.9 ක් වේ. ඒ අතුරින් 46.5% ක් සේවා අංශයේ ද 27.1 % කෘෂිකර්මික අංශයේ ද 26.4% කර්මාන්ත අංශයේ ද නිරත වී ඇත. ඉහලම සේවා නියුක්තියක් සේවා අංශයේ දක්නට ලැබෙන අතර කර්මාන්ත අංශයේ නියෝජනය අවම අගයක් ගනී. තවද රැකියා නියුක්තියෙන් 67.9% ක ප්‍රතිශතයක් සතියකට පැය 40 කට වඩා වැඩ කර ඇති බව වාර්තා වී ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් රැකියා නියුක්තිය, රැකියා වියුක්තිය හා ශ්‍රමබලකාය වැනි සංඛ්‍යාති රැසක උපනතිය පිළිබඳ කාලීන දත්ත ඉදිරිපත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය පවත්වනු ලබයි. මෙම සමීක්ෂණය 1990 වසරේ සිට කාර්තුමය පදනමක් යටතේ වාර්ෂිකව පවත්වාගෙන යනු ලබයි. 2016 වර්ෂයේදී පැවැත්වූයේ එම සමීක්ෂණ මාලාවේ 36 වැන්නයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිවාස ඒකක 25,750 ක නියැදියක් භාවිතයෙන් 2016 වසර සඳහා ශ්‍රම බල සංඛ්‍යාති නිකුත් කර ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව